# 19 සසුන සුරකි සංගායනා

බුදු දහමේ චිර පැවැත්ම සඳහා සිදු කෙරුණ විවිධ ක්‍රියාකාරකම් අතර ධර්ම සංගායනා ප්‍රමුඛ ස්ථානයක් ගනියි. ධර්ම සංගායනාවක් යනු ''බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා පනවන ලද විනය භික්ෂූන් වහන්සේලා එක් වී සජ්ඣායනා කිරීම'' යැයි සරල ව අර්ථකථනය කළ හැකි ය. එය තරමක් විස්තරාත්මක ව ඉදිරිපත් කළ හොත්, ඉන් අදහස් වන්නේ ශාසනාභිවෘද්ධිකාමී මහ තෙරවරුන් විසින් බුද්ධ වචනය ඒකරාශි කොට වැරැදි අදහස් ඇතුළත් වී ඇත්නම් ඒවා නිවැරැදි කොට ඇති වන ගැටලු ධර්ම විනයට අනුව විසඳමින්, ශාසන ශෝධනයක් ඇති කරලීම අරමුණු කොට ගෙන සිදු කරන ක්‍රියාවලියකි.

මේ උතුම් අරමුණ පෙරදැරි ව සිදු කළ සංගායනා පිළිබඳ ව ශාසන ඉතිහාසයේ සඳහන් වේ. ඒ අනුව ථේරවාදී බෞද්ධ සම්ප්‍රදාය මඟින් පැවැත්වූ සංගායනා හයකි. ඉන් පළමු වැන්න බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසක් ගිය තැන මගධ රාජ්‍යයේ රජගහ නුවර දී ද, දෙවැන්න බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයක් ගිය තැන විශාලා මහනුවර දී ද, තෙවැන්න බුදුරදුන් පිරිනිවන් පා වසර 236 ක් ගිය තැන පැළලුප් නුවර දී ද පවත්වා ඇත. හතර වන ධර්ම සංගායනාව ක්‍රි.පූ. පළමු වැනි සියවසේ ලංකාවේ මාතලේ අලුවිහාරයේ දී ද, පස් වන හා හය වන සංගායනාව මියැන්මාරයේ දී (බුරුමය) ද පවත්වා ඇත. මීට අමතර ව භාරතයේ ම පැවති හතර වන ධර්ම සංගායනාවක් ගැන ද ඉතිහාසයේ සඳහන් වෙයි. එය ථේරවාදී සම්ප්‍රදායට අයත් නොවෙයි. ලක්දිව දී සිදු කළ බව දැක්වෙන හතර වන ථේරවාදී සංගායනා ව පිළිබඳවත් භාරතයේ දී සිදු කළ හතර වන කණිෂ්ක සංගායනාව පිළිබඳවත් මෙම පාඩම තුළින් අපි උගනිමු.

## අලුවිහාර සංගීතිය හෙවත් සිව් වන ථේරවාද සංගීතිය

සියවස් පහකට වැඩි කාලයක් පවත්වාගෙන එන ලැබූ ථේරවාදී බුදු දහම පළමු වරට පුස්කොළ පොත්වල ලියවුණේ මෙම සංගීතියේ දී ය. ඒ නිසා ම මෙය පුස්තකාරූඪ සංගීතිය ලෙස ද හැඳින්වෙයි. බුද්ධ පරිනිර්වාණයේ පටන් ශාසන මාමක භාණක තෙරවරුන් විසින් මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන ආ ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීම මෙහි දී සිදු විය. එය ශ්‍රී ලාංකික ගෞරවනීය මහා සංඝරත්නය විසින් කරන ලද උතුම් යුග මෙහෙවරකි.

## සංගායනාව පැවැත්වීමට හේතු

ශාසන ඉතිහාසය විමසීමේ දී පුස්තකාරූඪ සංගීතිය පැවැත්වීමට ලාංකේය භික්ෂූන් වහන්සේලා පෙළඹවූ හේතු ගණනාවක් හඳුනා ගත හැකි ය.

1. බුදු දහම ලංකාවට ලැබුණු දා පටන් එය ආරක්ෂා කරමින් පවත්වා ගෙන එනු ලැබුවේ මහා විහාරීය භික්ෂූන් වහන්සේලා විසිනි. ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය නොමඳ ව ලැබුණි. නමුත් ක්‍රි.පූ. පළමු සියවසේ බලයට පත් වට්ටගාමිණී අභය හෙවත් වළගම්බා රජු දෙවන වර බලයට පත් වීමත් සමග මේ තත්ත්වයේ වෙනසක් ඇති විය. එම රජු විසින් තමන්ට දෙවන වර බලයට පත් වීමට උපකාර කළ කුපික්කල මහා තිස්ස හිමියන්ට ප්‍රතිඋපකාරයක් වශයෙන් අභයගිරිය කරවා පූජා කිරීමත් සමග ශාසනික අර්බුදයක් මෙරට නිර්මාණය විය. රජු අභයගිරි පාර්ශ්වයට හිතවත් ව කටයුතු කිරීමත් එම පාර්ශ්වය ඉන්දියාවෙන් පැමිණි ධර්මරුචි නම් භික්ෂුවගේ ඉගැන්වීම් ගුරුකොට ක්‍රියා කිරීමත් නිසා මහාවිහාරික භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කළ ථේරවාද බුදු දහමට අභියෝගයක් එල්ල විය. ධර්මරුචි තෙරුන් වහන්සේගේ ඉගැන්වීම් ථේරවාදී බුදුදහමට පටහැනි විය. අනාගතයේ දී එම දහම ථේරවාදී බුදු දහමට හානි කරනු ඇතැයි ලක්දිව තෙරවරුන් තුළ ඇති වූ සැකය මෙම සංගීතිය පැවැත්වීමට හේතු වූ එක් කරුණකි.

2. වළගම්බා රාජ්‍ය සමයේ බැමිණිතියා නම් සාගතයක් ද ඇති විය. මේ සාගතයට වසර දොළහක් මුළුල්ලේ පැවති මහා නියඟය බලපෑවේ ය. එම වකවානුවේ ගිහි ජනතාව මෙන් ම භික්ෂූන් වහන්සේ ද ආහාර අහේනියෙන් පෙළුණහ. ත්‍රිපිටකය කට පාඩමින් පවත්වා ගෙන ආ සමහර භික්ෂූන් වහන්සේලා මෙම සාගතය නිසා අහේනියෙන් අපවත් වූහ. ඇතැම් භික්ෂූන් වහන්සේලා ඉන්දියාවට වැඩම කොට ජීවිතය ආරක්ෂා කර ගත්හ. තවත් පිරිසක් හාමතේ මියයතත් ලක්බිම හැර නොයාමට තීරණය කොට මහවැලි ගඟේ වැලි තලාවේ වැතිර ත්‍රිපිටකය කට පාඩම් කළ බව සඳහන් වේ. සාගතය අවසානයේ ඉතිරි වූ භික්ෂූන් වහන්සේලා මහා විහාරයට රැස්වූ අතර දහම කට පාඩමින් ම පවත්වා ගෙන යාම මෙවන් තත්ත්වයක් යටතේ අනතුරුදායක බව අවධානයට යොමු කළහ.

3. වළගම්බා රාජ්‍ය සමය යුද ගැටුම්වලින් පිරුණකි. සිහසුනට පත් ව නොබෝ කලකින් දකුණු ඉන්දියාවෙන් පැමිණි ආක්‍රමණිකයෝ වළගම්බා රජතුමා පළවා හැර සිහසුන අත්පත් කර ගත්හ. ආක්‍රමණිකයන් සත් දෙනෙකු සිටි බව ද ඔවුන් එකිනෙකා මරා ගනිමින් දාහතර වසරක් රට පාලනය කළ බව ද සඳහන් වේ. භික්ෂූන් වහන්සේලාගේ මග පෙන්වීම ද දේශ හිතෛෂී ජන නායකයන්ගේ හා ප්‍රජාවගේ අනුග්‍රහය ද ඇති ව වළගම්බා රජතෙමේ අවසන් ආක්‍රමණිකයා පළවා හැර සිහසුනට පත් විය. මෙම දීර්ඝකාලීන යුද වාතාවරණය ශාසනික සංවිධානයේ යහපැවැත්මට මෙන් ම ථේරවාද බුදු දහමේ චිරස්ථිතියට ද හානිකර ලෙස බලපෑවේ ය. මුඛ පරම්පරාවෙන් ධර්මය පවත්වා ගෙන ගිය ගුරු ශිෂ්‍ය භික්ෂූහු විසිර

ගියහ. යුද බිය නිසා විටෙක වනගත වූහ; හුදෙකලා වූහ. ධර්මය මුඛ පරම්පරාවෙන් ගෙන යාමට අවශ්‍ය කාය චිත්ත විවේකය ද නැති විය. මේ තත්ත්වය තුළ යුද ගැටුම් අවසන් වූ පසු ත්‍රිපිටක ධර්මයේ සුරක්ෂිත බව සඳහා එය ග්‍රන්ථාරූඪ කිරීමේ වැදගත්කම තෙරුන් වහන්සේලාට පෙනී ගියේ ය.

4. ලක්දිව ඇතැම් භික්ෂූන් වහන්සේලා ශාසනික පිළිවෙතින් පිරිහී යාම ද අලුවිහාර සංගායනාව පැවැත්වීමට මහ තෙරවරුන් පෙළඹවූ තවත් කරුණකි. ධර්ම විනය මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන යෑමේ වගකීම පිළිවෙතින් පිරිහී යමින් සිටින සඟ පරපුර විසින් නිසි ලෙස ඉටු නොකරනු ඇතැයි මහ තෙරවරුන් තුළ සැකයක් ඇති වී යැයි සිතිය හැකි ය. මහා නිද්දේසයට ඇතුළත් ධර්ම කරුණු දන සිටි එක ම භික්ෂුව ද දුසිල් ජීවිතයක් ගතකළ බව සඳහන් වේ. මේ තත්ත්වය ද ත්‍රිපිටක ධර්මය ග්‍රන්ථාරූඪ කිරීමේ අවශ්‍යතාව ඇති කළ බව සැලකිය හැකි ය.

5. ලාංකේය භික්ෂූන් වහන්සේ මෙකල කණ්ඩායම් දෙකකට බෙදී සිටියහ. ග්‍රන්ථ ධුරය වඩන භික්ෂූන් හා විදර්ශනා ධුරය වඩන භික්ෂූන් වශයෙනි. ග්‍රන්ථ ධුරය වැඩූ භික්ෂූහු විදර්ශනා ධුරය වැඩූ භික්ෂූන්ට වඩා ප්‍රබල වූහ. ග්‍රන්ථ ධුරය වැඩීම සඳහා ත්‍රිපිටකය ලේඛනාරූඪ කිරීම වඩාත් වැදගත් වීම ද මෙම සංගායනාව පැවැත්වීමට හේතු වී තිබේ.

6. මේ වන විට ධර්මය ඇසීමටත්, ඉගෙනීමටත්, ඒ පිළිබඳ පර්යේෂණ පැවැත්වීමටත් ඇතැමුන් තුළ උනන්දුවක් ඇති වී තිබේ. එබඳු කටයුතු මුඛ පරම්පරාවෙන් පමණක් පවත්වාගෙන යාම අපහසු බව ඔවුනට වැටහිණි. ත්‍රිපිටකය ලේඛනගත කිරීමෙන් එයට විසඳුම් ලබා ගත හැකි බව තේරුම් ගැනිණි. මෙබඳු හේතු ගණනාවක් පදනම් කරගෙන ක්‍රි.පූ. පළමු සියවසේ මාතලේ අලුවිහාරයේ දී ප්‍රදේශීය නායකයෙකුගේ අනුග්‍රහ ඇති ව භික්ෂූන් වහන්සේ පන්සීයකගේ සහභාගිත්වයෙන් හතර වන ධර්ම සංගීතිය පවත්වන ලදි. එහි දී සිදු වූයේ පාලි භාෂාමය වූ ථේරවාද ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමයි.

## සංගායනාවේ ප්‍රතිඵල

1. ත්‍රිපිටක ධර්මය වාචෝත්ගත ව පවත්වාගෙන යාමෙන් එහි කිසි යම් විකෘතිතාවක් ඇති වීමට තිබූ ඉඩකඩ මේ තුළින් මගහැරී යාම

2. භික්ෂූන් වහන්සේ නිකායාන්තර වශයෙන් බෙදී විවිධ මතවාදයන්හි පිහිටා ධර්මය විවරණය කිරීම තුළින් ථේරවාද බුදු දහම විෂයෙහි එල්ල වීමට තිබූ අභියෝග අවම වීම

3. පසුකාලීන ථෙරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවල දී නැවත එය ස්ථාපිත කිරීමට මෙම ධර්ම ග්‍රන්ථ උපකාරී වීම

4. ලෝකයේ වෙනත් රටවල ථේරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවල දී නැවත ස්ථාපිත කිරීමට ග්‍රන්ථාරූඪ කොට සුරක්ෂිත ව පැවති ලාංකේය ධර්ම ග්‍රන්ථ උපකාරී වීම

5. බුදු දහම ව්‍යාප්ත නොවූ බටහිර රටවලට පසු කාලයේ ඒ පිළිබඳ දැනුම බෙදා හැරීමට මෙම ධර්ම ග්‍රන්ථ උපකාරී වීම යනාදිය සඳහන් කළ හැකි ය. විශේෂයෙන් රිස් ඩේවිඩ්ස් වැනි පඬිවරුන් එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම (PALI TEXT SOCIETY) පිහිටුවා ගනු ලැබුවේ මෙරට පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කොට බෙදා හැරීම සඳහා ය. ඒ තුළින් මෑත යුගයේ දී ථේරවාද බුදුදහම හැදෑරීමට හා ලොව පුරා ප්‍රචලිත කිරීමට බොහෝ අවකාශ සැලසුණි

## කණිෂ්ක ධර්ම සංගායනාව

භාරතයේ ධර්මාශෝක අධිරාජයාණන්ගෙන් අනතුරුව බුදුදහමේ උන්නතියට ඉමහත් සේවාවක් කළ නරපතියෙකු ලෙස කණිෂ්ක රජතුමා ඉතිහාසගත වේ. ඔහුගේ රාජ්‍ය කාලයේ (ව්‍ය.ව. 120-162) පවත්වන ලද ධර්ම සංගායනාව භාරතයේ පැවති හතර වන ධර්ම සංගායනාවයි. මෙම සංගායනාවට සහභාගි වූ පිරිසෙන් වැඩි දෙනා සර්වාස්තිවාදී භික්ෂූන් වූ නිසා මෙය සර්වාස්තිවාදී සංගායනාව ලෙස ද හැඳින්වේ.

## සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු

1. සංඝ සමාජය නිකාය වශයෙන් බෙදී ඒ ඒ නිකාය විසින් විවිධාකාරයෙන් බුදු දහම විවරණය කිරීම

කණිෂ්ක රජතෙමේ බුදු දහම වැළඳ ගැනීමෙන් අනතුරුව රජමැදුරට භික්ෂූන් වහන්සේ නමක් වැඩම කරවාගෙන ධර්මය ශ්‍රවණය කිරීමට යොමු විය. දෛනික ව ඒ ඒ භික්ෂූන් වහන්සේ කළ දේශනයන්හි දී එක ම ධර්ම කරුණ වුව ද වෙනස් ආකාරයෙන් විවරණය කෙරිණි. කණිෂ්ක රජතුමාට මෙය ගැටලුවක් විය. එවකට උගත් තෙර නමක් වූ පාර්ශව හිමියන්ගෙන් එසේ වීමට හේතු රජතුමා විමසී ය. එයට පිළිතුරු දෙමින් උන් වහන්සේ කියා සිටියේ භික්ෂූන් වහන්සේ නිකායික පිළිගැනීම් මත පිහිටා ධර්ම කරුණු විවරණය කිරීමට යෑම නිසා මේ තත්ත්වය ඇති වන බවයි.

මේ අනුව ධර්ම විනය පිළිබඳ ව ගොඩනැගී තිබූ පරස්පරතාවන් දුරු කොට බුද්ධ වචනය සංගීතිකාරක භික්ෂූන් පිළිගත් සම්ප්‍රදාය අනුව ගොනු කිරීමේ අවශ්‍යතාව මෙම සංගායනාව පැවැත්වීමට හේතු විය.

2. ත්‍රිපිටක පොත්පත් එක්රැස් කිරීම හා ඒවාට සර්වාස්තිවාදී ධර්මයට අනුව අටුවා සම්පාදනය කිරීමේ අවශ්‍යතාව

මෙබඳු හේතූන් මුල්කරගෙන කණිෂ්ක රජතුමා සංගායනාවක් පැවැත්වීමට තීරණය කොට ඒ බව පාර්ශව තෙරුන්ට දන්වා ඇත. පාර්ශව තෙරුන් මේ පිළිබඳ ව වසුමිත්‍ර හිමියන් දැනුම්වත් කළ අතර කණිෂ්ක රජතුමාගේ අනුග්‍රයෙන් එම සංගීතිය පවත්වන ලදි. සංගීතියේ ප්‍රධානත්වය පාර්ශව තෙරුන්ට පැවරුණු අතර එහි සභාපතිත්වය පැවරුණේ වසුමිත්‍ර තෙරුන්ට ය. සර්වාස්තිවාදී නිකායට අයත් උගත් භික්ෂූන් වහන්සේලා 500 නමක් මෙයට සහභාගි කර ගත් අතර මාස හයක් මුළුල්ලේ සංගීතිය පැවැත්වුණි. මෙයට සහභාගි වූ සියලුම භික්ෂූන් වහන්සේ බෝධිසත්වවරුන් ලෙස ද සැලකෙති.

## සංගීතියේ ප්‍රතිඵල

1. සූත්‍ර, විනය, අභිධර්ම යන ත්‍රිපිටකයට විභාෂා නම් සර්වාස්තිවාදී අටුවා ග්‍රන්ථ සම්පාදනය වීම
   (ඒ අනුව විනය පිටකය සඳහා විනය විභාෂා ද, සූත්‍ර පිටකය සඳහා උපදේශ ශාස්ත්‍රය ද, අභිධර්ම පිටකය සඳහා අභිධර්ම විභාෂා ශාස්ත්‍රය ද සම්පාදනය කෙරුණි.)
2. අටුවා ග්‍රන්ථ තඹපත් ඉරුවල ලියවා සෙල්මුවා මංජුසාවල බහා ස්තූපයක තැන්පත් කරමින් ඒවායෙහි සුරක්ෂිතතාව තහවුරු කිරීම
3. පාලියෙන් පැවති ත්‍රිපිටක බුද්ධ ධර්මය සංස්කෘත භාෂාවට පරිවර්තනය වීම
4. විසිරී පැවති ගුරුකුල එක නිකායක් යටතට ගැනීම නිසා මහායාන සම්ප්‍රදාය ආරම්භ වීම
5. මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරය සඳහා ධර්ම දූත පිරිස් යෙදවීම

තෙවන සංගායනාවෙන් පසු අශෝක රජතුමාගේ අනුග්‍රහයෙන් නව රට ථේරවාද ධර්ම ප්‍රචාරක කටයුතු සිදු කළා සේ ම කණිෂ්ක රජතුමාගේ අනුග්‍රහයෙන් මධ්‍ය ආසියාව හරහා පැවැති තවලම් මාර්ගවල තැන තැන පිහිටි රාජ්‍යයන්හි මහායාන ධර්මය ප්‍රචාරය කරවීම.

මෙබඳු ප්‍රතිඵල රැසක් උදාකරලීමට කණිෂ්ක සංගීතිය උපකාර වූ බව පැහැදිලි ය. ඒ අනුව ථේරවාදීන් මෙන් ම මහායානිකයින් ද ධර්මයෙහි සුරක්ෂිතතාව හා ව්‍යාප්තිය පිණිස ගෙන ඇති පියවර මෙම සංගායනාවලින් අපට වටහා ගත හැකි වෙයි.

**පොදුවේ ගත් කල මේ සෑම සංගායනාවකින් ම සමාජයට වැදගත් ආදර්ශ කිහිපයක් ලබා දේ.**


- **සමාජය තුළ ඇති වන ඕනෑ ම ගැටලුවක දී සාකච්ඡා මාර්ගයෙන් විසඳුම් ලබා ගැනීමට හැකි බව**
- **සුරක්ෂිත කළ යුතු දෑ නිසි අවස්ථාවන්හි දී සුරක්ෂිත කිරීමට පෙළඹීම තුළින් පසු කාලීන ව ඇති වන බොහෝ ගැටලු අවම කර ගත හැකි බව**

## සාරාංශය



ශාසන ඉතිහාසය තුළ සංගායනා ගණනාවක් පිළිබඳ තොරතුරු දැක්වේ. ඒ අතර හතර වන ධර්ම සංගායනා දෙකක් පිළිබඳ ව සඳහන් වේ. එයින් එකක් ථේරවාදී සංගායනා මාලාවේ හතර වැන්නයි. එය ලංකාවේ මාතලේ අලුවිහාරයේ දී වළගම්බා රජු දවස පවත්වා ඇත. අනෙක භාරතයේ පැවති හතර වන සංගායනාවයි. එය කණිෂ්ක රජු දවස කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ දී පවත්වා ඇත. එය ථේරවාදී බුදුදහමට වෙනස් සර්වාස්තිවාදී නිකායට අයත් වූවකි. කුමන සංගායනාවක් වුව ද ශාසන චිරස්ථිතිය හා ව්‍යාප්තිය උදා කරලීමට හේතු වී ඇත. සාකච්ඡා මාර්ගයෙන් විසඳුම් සෙවීම හා සුරක්ෂිත කළ යුතු ධර්ම විනය සුරක්ෂිත කිරීම සංගායනා පැවැත්වීමට හේතු වූ බව පැහැදිලි වේ.

## ක්‍රියාකාරකම



1. මාතලේ අලුවිහාර සංගීතිය හා කණිෂ්ක ධර්ම සංගීතිය ඇසුරු කරගෙන පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| කාලය | පැවැත් වූ ස්ථානය | මූලිකත්වය | අනුග්‍රහය | සංගීතියට සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | | |

2. මෙම සංගීති දෙක ම පැවැත්වීමට බලපෑ කරුණු දෙක බැගින් ලියන්න.

## පැවරුම



ථේරවාදී සංගායනා හතර හා කණිෂ්ක සංගීතිය ශාසන චිරස්ථිතියට හා ව්‍යාප්තියට උපකාරී වූ ආකාරය විස්තර කරමින් පුවත්පතක පළ කිරීමට සුදුසු ලිපියක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.